# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 14,724/3 — 1966 දෙසැම්බර් 3 වැනි සෙනසුරාද — 1966.12.3

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)


# I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

## මිල පාලන දැන්වීම්

**සී. 418 වැනි අංකය දරණ ආහාර මිළ නියෝගය** — **අතිරේක ආහාර ද්‍රව්‍ය—වියලි මිරිස්**

### මිළ පාලන පනත

#### නියෝගය

දිවයිනේ නියෝජ්‍ය මිල පාලක (ආහාර) තැන්පත් මහින්ද බ්‍රායන් සේනානායක වන මම, (173 වන අධිකාරය වන) මිළ පාලන පණතේ 3(2) වෙනි වගන්තිය සමග කියවිය යුතු 4 වෙනි වගන්තියෙන් මා වෙත පැවරී තිබෙන බලතල අනුව—

(1) මිට යාකර ඇති 1 වෙනි තීරයේ සඳහන් ද්‍රව්‍යය තොග වෙළෙන්දෙකු විසින් තොග වශයෙන් විකිණීමේදී දළ බර හොණ්ඩරයක්ද, සිල්ලර වෙළෙන්දෙකු විසින් සිල්ලර වශයෙන් විකිණීමේදී ශුද්ධ බර රාත්තලක්ද, ශ්‍රී ලංකාද්වීපය ඇතුලත විකිණිය හැකි උපරිම මිල දැන් පටන් මෙහි උප ලේඛණයේ 2 වෙනි හා 3 වෙනි තීරුවල අනුපිළිවෙලින් සඳහන් කර තිබෙන මිල ගණන් බව මෙම නියෝගයෙන් නියම කරමි.

(2) තවද, මෙම නියෝගයේ කාර්ය සඳහා—

(අ) උපලේඛණයේ 1 වෙනි තීරයේ සඳහන් ද්‍රව්‍යයක ඕනෑම ප්‍රමාණයක් නැවත විකිණීම සඳහා විකිණීම හෝ උපලේඛණයේ 1 වෙනි තීරයේ සඳහන් කිසිම ද්‍රව්‍යයක් වරකට දළ බර හොණ්ඩරයක් හෝ ඊට වැඩි ප්‍රමාණය බැගින් කොයි අන්දමට විකිණීම හෝ තොග වශයෙන් විකිණීමක් ලෙස සලකනු ලබන බවත් ;

(ආ) උපලේඛණයේ සඳහන් යම් ද්‍රව්‍යයකින් පාරිභෝගය පිණිස හෝ පාවිච්චිය පිණිස හෝ දළබර හොණ්ඩරයකට අඩු ඕනෑම ප්‍රමාණයක් විකිණීම සිල්ලර වශයෙන් විකිණීමක් ලෙස සලකනු ලබන බවත් මෙම නියෝගයෙන් නියම කරමි.

(3) එසේම මෙම නියෝගයෙන් වැඩිම මිළ ගණන් නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම, උපලේඛණයේ 1 වෙනි තීරයේ සඳහන් කිසිම ද්‍රව්‍යයක් වෙන ද්‍රව්‍යයක් සමග මිශ්‍ර කිරීමෙන් බාල කොට කිසිවකු විසින් නොවිකිණිය යුතු බව නියම කරමි.

(4) තවද, මෙම නියෝගයෙන් වැඩිම මිළ ගණන් නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම යම් ස්ථානයක හෝ යම් වාහනයක උප ලේඛණයේ 1 වෙනි තීරයේ සඳහන් යම් ද්‍රව්‍යයක් සිය ස්වාමිත්වයේ හෝ පාලනය යටතේ හෝ තබාගෙන සිටින සෑම වෙළෙන්දෙකුම එවැනි ද්‍රව්‍යය කින් ප්‍රමාණයන් සුදුසු භාජනයක දමා එම ද්‍රව්‍ය සඳහා මේ නියෝගයේ වැඩිම මිළ උසින් අඟලකට වඩා අඩු නොවූ ඉලක්කම්වලින් මිළ පුවරුවක සටහන් කොට එම භාජනයට සම්බන්ධ කොට, එකී ද්‍රව්‍යය හා නියමිත වැඩිම මිළ ඕනෑම ගණුදෙනුකාරයෙකුට පැහැදිලිව පෙනෙන සේ එකී ස්ථානයේ හෝ වාහනයේ තැබිය යුතු බව නියම කරමි.

(5) එසේම මෙම නියෝගයේ කාර්‍ය සඳහා "රාත්තල" හෙවත් "රා." යන්නෙන් සළකනු ලබන්නේ ඇවර්ඩුපොයි බර ක්‍රමය අනුව සම්මත රාත්තලේ බර බවද නියම කරමි.

(6) තවද, මෙම නියෝගයෙන් වැඩිම මිළ නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම උපලේඛණයේ 1 වෙනි තීරයේ සඳහන් යම් ද්‍රව්‍යයක් තොග වශයෙන් විකුණන සෑම තැනැත්තෙකු හා උපලේඛණයේ 1 වෙනි තීරයේ සඳහන් යම් ද්‍රව්‍යයක් සිල්ලර වශයෙන් විකුණන සෑම තැනැත්තෙකු විසින්ම මිළයට ගන්නා ඉල්ලුවහොත් පහත සඳහන් විස්තර, එනම් :—

(අ) විකුණූ දිනය ;

(ආ) එම ද්‍රව්‍යයන් විකුණූ ප්‍රමාණය (බර අනුවයි) :

(ඇ) විකුණූ ප්‍රමාණය සඳහා ගෙවූ මුදල ;

(ඈ) වෙළෙඳාමේ ස්වභාවය, එනම් වෙළඳාම තොග වශයෙන්ද, සිල්ලර වශයෙන්ද යන වග ඇතුළත් කුවිතාන්සියක් මිළයට ගන්නාට දිය යුතු බවද නියම කරමි.

(7) උපලේඛණයේ 1 වැනි තීරයේ සඳහන් යම් ද්‍රව්‍යයක් විකුණන විට ඒ විකුණනු ලබන ද්‍රව්‍ය යම්කිසි දෙයක ඔතනු ලැබේ නම්, එහි මිළත්, උපලේඛණයේ 2 වෙනි සහ 3 වෙනි තීරවල සඳහන් වැඩිම මිළ ගණන්වලට ඇතුළත් වන බවද නියම කරමි.

1966 දෙසැම්බර් 2 වැනි දින ප. ව. 3.00 ට කොළඹදී අත්සන් කරණ ලදී

ඇම්. බී. සේනානායක,
දිවයිනේ නියෝජ්‍ය මිළ පාලක (ආහාර).


998/5——ආර්ආර් 19448—11,925 (66/12)

## උප ලේඛනය

| 1 වැනි තීරය<br>වර්ගය | 2 වැනි තීරය<br>තොග වෙළෙන්දෙකු විසින් දළබර හොණ්ඩරයක් තොග වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ<br>රු. ශ. | 3 වැනි තීරය<br>සිල්ලර වෙළෙන්දෙකු විසින් ශුද්ධ බර රාත්තලක් විකිණිය හැකි වැඩිම මිළ<br>රු. ශ. |
|---|---|---|
| වියලි මිරිස් ... ... ... | 180 0 | 1 90 |

සැළකිය යුතුයි.—මේ මිළ ගණන් ඉහත සඳහන් ද්‍රව්‍ය විකිණිය යුතු නියමිත මිළ නොවේ. මේවා එම ද්‍රව්‍ය විකිණිය හැකි වැඩිම මිළ ගණන්ය. එම මිළ ගණන්වලට ඉහලින් එම ද්‍රව්‍ය විකිණිය නොහැකිය.

12–531/1

---

පි. 417 වැනි අංකය දරණ ආහාර මිළ නියෝගය

අතිරේක ආහාර ද්‍රව්‍ය

## මිල පාලන පනත

### නියෝගය

දිවයිනේ නියෝජ්‍ය මිල පාලක (ආහාර) තැන්පත් මහින්ද බ්‍රායන් සේනානායක වන මම, (173 වන අධිකාරය වන) මිළ පාලන පණතේ 3 (2) වෙනි වගන්තිය සමග කියවිය යුතු 4 වෙනි වගන්තියෙන් මා වෙත පැවරී තිබෙන බලතල අනුව—

(1) 1966 නොවැම්බර් 23 වෙනි දින අංක 14,722/6 දරණ ලංකාණ්ඩුවේ අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද 1966 නොවැම්බර් 23 වෙනි දින අංක පි 416 දරණ ආහාර මිළ නියෝගය මේ දුන් සිට මෙම නියෝගයෙන් අවලංගු කරමි.

(2) තවද, මීට යාකර ඇති උපලේඛනයේ 1 වෙනි තීරයේ සඳහන් එක් එක් ද්‍රව්‍යය වෙරටව ගෙන්වන්නෙකු විසින් තොග වශයෙන් විකිණීමේදී දලබර හොණ්ඩරයක්ද, තොග වෙළෙන්දෙකු විසින් තොග වශයෙන් විකිණීමේදී දළබර හොණ්ඩරයක්ද, සිල්ලර වෙළෙන්දෙකු විසින් පාරිභෝගිකයෙකුට සිල්ලර වශයෙන් විකිණීමේදී ශුද්ධ බර රාත්තලක්ද, කොළඹ නගරයේ නාගරික සීමාවන් ඇතුලත විකිණිය හැකි වැඩිම මිළ මේ දුන් පටන් මේ උපලේඛනයේ 2 වෙනි, 3 වෙනි හා 4 වෙනි තීරවල අනුපිළිවෙලින් සඳහන් කර තිබෙන මිළ ගණන් බව මෙම නියෝගයෙන් නියම කරමි.

(3) තවද, මෙම නියෝගයේ කාර්ය සඳහා—

(අ) උපලේඛනයේ 1 වෙනි තීරයේ සඳහන් ද්‍රව්‍යයක ඕනෑම ප්‍රමාණයක් නැවත විකිණීම සඳහා විකිණීම හෝ උපලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් කිසිම ද්‍රව්‍යයක් වරකට දළබර හොණ්ඩරයක් හෝ ඊට වැඩි ප්‍රමාණය බැගින් කොයිඅන්දමට විකිණීම හෝ තොග වශයෙන් විකිණීමක් ලෙස සලකනු ලබන බවත් ;

(ආ) උපලේඛනයේ සඳහන් යම් ද්‍රව්‍යයකින් පාරිභෝගය පිණිස හෝ පාවිච්චිය පිණිස හෝ දළබර හොණ්ඩරයකට අඩු ඕනෑම ප්‍රමාණයක් විකිණීම සිල්ලර වශයෙන් විකිණීමක් ලෙස සලකනු ලබන බවත් මෙම නියෝගයෙන් නියම කරමි.

(4) එසේම මෙම නියෝගයෙන් වැඩිම මිළ ගණන් නියම කරණු ලැබූ සෑම ප්‍රදේශයකම, උපලේඛනයේ 1 වෙනි තීරයේ සඳහන් කිසිම ද්‍රව්‍යයක් වෙන ද්‍රව්‍යයක් සමග මිශ්‍ර කිරීමෙන් බාල කොට කිසිවකු විසින් නොවිකිණිය යුතු බව නියම කරමි.

(5) තවද, මෙම නියෝගයෙන් වැඩිම මිළ ගණන් නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම යම් ස්ථානයක හෝ යම් වාහනයක උපලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් යම් ද්‍රව්‍යයක් සිය ස්වාමිත්වයේ හෝ පාලනය යටතේ හෝ තබාගෙන සිටින සෑම වෙළෙන්දෙකුම එවැනි ද්‍රව්‍යය කිසි ප්‍රමාණයක් සුදුසු භාජනයක දමා එම ද්‍රව්‍ය සඳහා මේ නියෝගයේ වැඩිම මිළ උසින් අඟලකට වඩා අඩු නොවූ ඉලක්කම්වලින් මිළ පුවරුවක සටහන් කොට එම භාජනයට සම්බන්ධ කොට, එකී ද්‍රව්‍යය හා නියමිත වැඩිම මිළ ඕනෑම ගණුදෙනුකාරයෙකුට පැහැදිලිව පෙනෙනයේ එකී ස්ථානයේ හෝ වාහනයේ තැබිය යුතු බව නියම කරමි.

(6) එසේම මෙම නියෝගයේ කාර්‍ය සඳහා ''රාත්තල'' හෙවත් ''රා.'' යන්නෙන් සළකනු ලබන්නේ ඇවර්දූපොයි බර ක්‍රමය අනුව සම්මත රාත්තලේ බර බවද නියම කරමි.

(7) තවද, මෙම නියෝගයෙන් වැඩිම මිළ නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම, උපලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් යම් ද්‍රව්‍යයක් තොග වශයෙන් විකුණන සෑම තැනැත්තෙකු හා උපලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් යම් ද්‍රව්‍යයක් සිල්ලර වශයෙන් විකුණන සෑම තැනැත්තකු විසින්ම මිළයට ගන්නා ඉල්ලුවහොත් පහත සඳහන් විස්තර, එනම්:—

(අ) විකුණූ දිනය;

(ආ) එම ද්‍රව්‍යයෙන් විකුණූ ප්‍රමාණය (බර අනුවයි):

(ඇ) විකුණූ ප්‍රමාණය සඳහා ගෙවූ මුදල;

(ඈ) වෙළෙඳාමේ ස්වභාවය, එනම් වෙළෙඳාම තොග වශයෙන්ද, සිල්ලර වශයෙන්ද යනවග ඇතුළත් කුවිතාන්සියක් මිළයට ගන්නාට දිය යුතු බවද නියම කරමි.

(8) උපලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් යම් ද්‍රව්‍යයක් විකුණන විට ඒ විකුණනු ලබන ද්‍රව්‍ය යම්කිසි දෙයක ඔතනු ලැබේ නම්, එහි මිළත්, උපලේඛනයේ 2 වෙනි 3 වෙනි හා 4 වෙනි තීරවල සඳහන් වැඩිම මිළ ගණන් වලට ඇතුළත් වන බවද නියම කරමි.

1966 දෙසැම්බර් 2 වෙනි දින අ.භා. 3.00 ට කොළඹදී අත්සන් කරණ ලදී.

ඇම්. බී. සේනානායක,
දිවයිනේ නියෝජ්‍ය මිල පාලක (ආහාර).

## උපලේඛනය

| 1 වැනි තීරය<br>වර්ගය | 2 වැනි තීරය<br>මෙරටට ගෙන්වන්නකු විසින් දළබර හොණ්ඩරයක් තොග වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ<br>රු. ශ. | 3 වැනි තීරය<br>තොග වෙළෙන්දෙකු විසින් දළබර හොණ්ඩරයක් තොග වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ<br>රු. ශ. | 4 වැනි තීරය<br>සිල්ලර වෙළෙන්දෙකු විසින් ශුද්ධබර රාත්තලක් විකිණිය හැකි වැඩිම මිළ<br>ශ. |
|---|---|---|---|
| ඇනු (රතු ඇනු සහ චික්බෙලාපූර් හැර වෙනත් සියළුම) | 21 0 | 22 50 | 26 |
| කොත්තමල්ලි | 59 0 | 61 0 | 64 |
| මුං ඇට | 39 50 | 40 75 | 41 |
| තෝර පරිප්පු | 44 0 | 45 75 | 47 |
| කඩල පරිප්පු | 46 25 | 47 50 | 48 |
| සියඹලා | 39 0 | 41 0 | 48 |
| අර්තාපල් | 26 0 | 27 50 | 30 |
| රතුඇනු | — | 24 0 | 28 |

සැළකිය යුතුයි.—(1) මේ මිළ ගණන් ඉහත සඳහන් ද්‍රව්‍ය විකිණිය යුතු නියමිත මිළ නොවේ. මේවා ඒ ඒ ද්‍රව්‍ය විකිණිය හැකි වැඩිම මිළ ගණන් ය. එම මිළ ගණන්වලට ඉහළින් ඒ ද්‍රව්‍යයන් විකිණිය නොහැකි ය.

(2) මෙරටට ගෙන්වන්නෙකු විසින් අය කරන මිළ හොණ්ඩර 10 ක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් විකුණන විට අය කරන මිළ විය යුතුය.

12–531/2

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රිතයි